# දරුවන් උදෙසා බයිබලයක්

# යේසුස් වහන්සේගේ උත්පත්තිය



ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: M. Maillot

අදහසක් වඩා සරල ස්වරූපයකින් ප්‍රකාශ කරන්නා

සකස්කරන්නා: E. Frischbutter; Sarah S.

60 - 36 වන කථාන්තරය

www.M1914.org

***Bible for Children,*** *PO Box 3, Winnipeg, MB R3C 2G1 Canada*

අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.

සිංහල

Sinhalese






''මා පුරුෂයකු නාඳුනන බැවින් මෙය සිදු වන්නේ කෙසේදැ''යි බියට පත් මරියා විමසුවාය. දේවදූතයා ඇට උත්තර දෙමින්, උපදින්නට සිටින තැනැත්තේ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ යයි කියනු ලබන්නේය. ඔහුට මිහිපිට පියකු නොමැත.



3

දේවදූතයා මරියාට කියනුයේ ''නුඹට නෑයා වූ එළිසබෙත් ඇගේ මහලු වයසේදී පුත්‍රයකු පිළිසිඳ ගෙන සිටින්නීය.'' මෙය ද පුදුම හාස්කමකි. ඉතා ඉක්මණින් මරියා එළිසබෙත් බැලීමට ගියාය. ඔවුහු එක්ව දෙවියන් වහන්සේට ප්‍රශංසා කළහ.



4

මරියා ජෝසෙප් නම් මනුෂ්‍යයකුට විවාහ බස් දී සිටියාය. මරියා දරුවකු පිළිසිඳ ඇති බව දැනගත් විට ජෝසෙප් කැළඹුණේය. බිහිවීමට සිටින දරුවා වෙන යම් කෙනෙකුගේ දරුවෙකැයි ජෝසෙප් අනුමාන කළා.



5

සිහිනයකින් ස්වාමින් වහන්සේගේ දූතයෙක් ජෝසෙප්ට කථා කොට, ''බිය නොවන්න, මොහු දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝය. ජේසුස් වහන්සේ බලාගැනීමට ජෝසෙප් මරියාට උදව් විය.



6

ජෝසෙප් දෙවියන් වහන්සේට කීකරුව විශ්වාසවන්තව සිටියේය. ඔහුගේ රටේ නීතිරීතිවලට ද ඔහු යටත් විය.



7

රටේ පැවති අලුත් නීතියක් නිසා ජෝසෙප් සහ මරියා තමන්ගේ අයබදු ගෙවීම සඳහා උපන් බිම වූ බෙත්ලෙහෙමට පිටත්ව ගියහ.



8


මරියා ඇගේ දරුවා බිහි කිරීමට සූදානමින් සිටියාය. එනමුත් නැවතීමට සුදුසු තැනක් සොයාගැනීමට ජෝසෙප්ට නොහැකි වියඃ සියලුම තානායම් ජනයාගෙන් පිරී තිබිණි.
9
අන්තිමේදී ජෝසෙප්ට ගව මඩුවක් සම්බ වුණා. එහිදී ජේසුස් වහන්සේ ඉපදුණා. මව දරුවා ගව ඔරුවක බාවා තැබුවා. ගව ඔරුව යනු ගවයින්ට ආහාර දමන තැනක්.
10
ළඟ අහල පහළ සිටි එඬේරු ඔවුන්ගේ නිදා සිටින බැටළුවන් රැකබලාගනිමින් සිටියා. දෙවියන් වහන්සේගේ දූතයා ඔවුනට අනඟි පණිවුඩයක් රැගෙන පැමිණියා.
11
අද දින දාවිත්ගේ නුවර ක්‍රිස්තුස් නම් ගැළවුම්කරු ඉපදී ඇත. ළදරුවා ගව ඔරුවක බහා තිබෙනු ඔබට සම්බ වනු ඇත.
12
සැණෙකින් බොහෝ දේවදූතයෝ විත් දෙවියන් වහන්සේට ප්‍රශංසා කරමින් කියනුයේ ...
13
... ''උස් තන්හි දෙවියන් වහන්සේට මහිමයත් පොළොවෙහි සමාදානයත් මනුෂ්‍යයන් කෙරෙහි යහපතත් සිදු වේවා.''
14



එඬේරෙක් ඉක්මණින් ගවලෙන වෙත පිය නැගුවා. දේවදූතයන් ඔවුන්ට පැවසූ පරිදි ජේසුස් නම් ළදරුවා දුටු බව ඔවුහු සැමටම පැවසූහ.
15
දින හතළිහකට පසුව ජෝසෙප් සහ මරියා ජේසුස් වහන්සේ රැගෙන ජෙරුසලම් මාලිගාවට පැමිණියාෂ එහි සිටි සීමොන් දරුවා ගැන දෙවියන් වහන්සේට ප්‍රශංසා කළා. තවද එහිදී දෙවියන් වහන්සේගේ දාසියක වූ, වියපත්ව සිටි හන්නා දරුවා දැක දෙවියන් වහන්සේට ප්‍රශංසා කළාය.
16
ඔවුන් දෙදෙනාම දැනගත්තා, මේ දෙවියන් වහන්සේගේ පුත්‍රයා, එනම් පොරොන්දු වූ ගැළවුම්කරු බව. ජෝසෙප් පක්ෂීන් දෙදෙනෙකු පූජා කළා. දිළිඳු අය තම අලුත උපන් දරුවන් කැප කිරීමේදී පූජා කිරීමට නියමිත වූ පූජාව එයයි.
17
ටික කලකට පසු පෙරදිග සිටි පඬිවරුනට තරුවක් මඟින් ජෙරුසලම වෙත යාමට මඟ පෙන්වීමක්
ලැබුණා. ඔවුහු ජෙරුසලමට පැමිණ, ''ජුදෙව්වරුන්ගේ රජ වීමට උපන් දරුවා කොහේද? අපි ඔහු නැමදීමට ආවෙමු'' යි කීහ.
18
හොරොද් රජු හට පඬිවරුන් පිළිබඳ අසන්නට ලැබුණා. ජේසුස් බිළිඳා මුණගැසුණු කල තමාට දන්වන්නැයි කලබලයට පත් වූ රජු ඔවුන්ගෙන් ඉල්ලා සිටියා. නමුත් ඔහු කළේ බොරුවක්. හෙරොද්ට ජේසු බිළිඳා මරන්නටයි අවශ්‍ය වුණේ.
19
ජෝසෙප්, මරියා සහ ළදරුවා සිටි ස්ථානය පිළිබඳව, තාරකාව විසින් පඬිවරුන්ට නිවැරදි මඟ පෙන්වනු ලැබුවා. ඔවුහු ජේසුස් බිළිඳා ඉදිරියේ දණ නමා නමස්කාර කරමින්, ගෙන ආ රත්‍රං හා සුවඳ ලාටු පූජා කළා.
20













යේසුස් වහන්සේගේ උත්පත්තිය

දේව වචනයෙන් එක් කථාවක්

බයිබලයේ

මතෙව් 1-2; ලූක්1-2

''ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ''
ගීතාවලිය 119:130

දෙවියන් වහන්සේ දන්නවා, අප වැරදි කර ඇති බව.
එම වැරදි උන් වහන්සේ පාපය ලෙස හඳුන්වන සේක.
පාපයේ කුලිය නම් මරණයයි.

උන් වහන්සේ ජීවමානව නැවත ස්වර්ගයට නැගුණු නිසා
අපගේ පාප උන් වහන්සේට කමා කළ හැක. ඔබට පාපයෙන්
මිදීමට අවශ්‍ය නම් දෙවියන් වහන්සේට කියන්න.

ආදර දෙවි පියාණෙනි, ජේසුස් වහන්සේ මා වෙනුවෙන් මැරී
නැවත නැගිටුණු බව මම විශ්වාස කරමි. මගේ ජීවිතයට පැමිණ
මගේ පව්වලට කමාව දුන මැනව. එවිට මට ඔබ වහන්සේ සමඟ
නව ජීවිතයක් ගත කළ හැක. සදාකාලයටම ඔබ සමඟ ඔබේ
දරුවකු ලෙස ජීවත්වීමට උදව් කළ මැනව. ආමෙන්.
ජොහන් 3:16

සැමදාම බයිබලය කියවමින් දෙවියන් වහන්සේට යාච්ඤා කරන්න.